සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

8 ශ්‍රේණිය | කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජේසුස් වහන්සේ වැඩසිටින බව ප්‍රකාශ කළේ කවුද?

(1) ශුද්ධ වූ තෙර්ගුල්ලියස් තුමා (2) ශුද්ධ වූ මුරේනියුස් තුමා

(3) ශුද්ධ වූ ජස්ටින් තුමා (4) ශුද්ධ වූ අගුස්තීනු තුමා

02 ශුද්ධාත්මයාණන් සංකේතවත් කරලු ලබන්නේ ................................. ආකාරයෙනි.

(1) ගිරවෙකු (2) පරවියෙකු (3) දේදුන්නක් (4) වළාකුලක්

03 පරිත්‍යාගශීලී බවේ උතුම්ම ආදර්ශය වන්නේ,

(1) පාස්කු යාගයයි. (2) බෙදාගැනීමයි.

(3) සමාවදීමයි. (4) පාද දෝවනයයි.

04 ''ජීවනදායක භෝජනය මමය. මා වෙත පැමිණෙන යමෙක් වේද ...........................'' යයි ජේසුස් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) ඔහුට කරදරයක් නොවන්නේ ය (2) ඔහුට සාගිනි නොවන්නේ ය

(3) ඔහුව මම රැකබලා ගන්නෙමි (4) ඔහුට පිපාස නොවන්නේ ය

05 ජේසුස් වහන්සේ වදාළ පරිදි යමෙකු වතුරෙන් ද, ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට සිදුවන දෙය වන්නේ,

(1) ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකි වීමයි.

(2) ඔහුගේ පාපවලට සමාව නොලැබීමයි.

(3) මීසමේ සාමාජිකත්වය අහිමිවී යාමයි.

(4) සමාජයෙන් කොන්වී යාමයි.

06 ජාකොබ් තුමා දේව ක්‍රියාකාරීත්වය අත්දුටු ස්ථානය වන්නේ,

(1) හෙබ්‍රොන් (2) බෙයර්ෂෙබා (3) හාරාන් (4) බෙතෙල්

07 අපගේ උත්තම පූජකයාණන් වන්නේ,

(1) අගරදගුරුතුමාය (2) ශුද්ධෝත්තම පාප් වහන්සේය

(3) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේය (4) මීසම් භාර පියතුමාය

08 දෙවියන් වහන්සේ මෝසෙස්ට අනාවරණය කළ නාමය වන්නේ,

(1) මම වනාහි මහා බලසම්පන්න තැනැන්වහන්සේ වෙමි.

(2) මම වනාහි කාරුණික තැනැන්වහන්සේ වෙමි.

(3) මම වනාහි ස්වයභූ නම් තැනැන්වහන්සේ වෙමි.

(4) මම වනාහි සියල්ල දානය කරන දෙවියන්වහන්සේ වෙමි.

09 යුක්තියට සාපිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු ........................................................ හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය.

(2) දේශය උරුමකර ගන්නෝය.

(3) සැනසීම ලබන්නෝය.

(4) තෘප්තිමත් වන්නෝය.

10 ජුසේවාස් පියතුමා අයත් නිකාය වන්නේ,

(1) ඔරතෝරියානු නිකාය (2) ජේසු නිකාය

(3) ෆ්‍රැන්සිස්කන් නිකාය (4) අගොස්තීනු නිකාය

11 අපට ප්‍රඥාව, ධෛර්යය, තේරුම්ගැනීම යන දීමනා ලැබෙන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය මගිනි.

(2) ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානය මගිනි.

(3) පූජකවරය ප්‍රසාද නිධානය මගිනි.

(4) රෝගීන්ගේ ආලේපනය ප්‍රසාද නිධානය මගිනි.

12 දරුවන්ට පළමුවරට තම විශ්වාසයේ ප්‍රකාශනය ලබාගන්නා වූ ස්ථානය වන්නේ,

(1) දේවස්ථානයයි. (2) තම පාසලයි. (3) දහම් පාසලයි. (4) තම නිවසයි.

13 ඔටු ලොම් වස්ත්‍රයක් ඇඳ, පාළුකරයෙහි දේශනා කරමින් ජනතාවට මනස්ථාපනය වීමට ආරාධනා කළේ,

(1) යෙසායා දිවැසිවරයා ය (2) මෝසෙස් තුමාය

(3) ස්නාවක ජොහාන් තුමාය (4) ආමොස් දිවැසිවරයා ය

14 අප ශුද්ධාත්ම මන්දිරයක් බවට පත්වන්නේ කුමන ප්‍රසාද නිධානය ලබාගත් විටද?

(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) ප්‍රසාද ස්නාපනය

(3) පූජකවරය (4) අභිවෘද්ධි ආලේපය

15 ජනවන්දනාවේ කේන්ද්‍රය වන්නේ,

(1) ප්‍රසාද නිධාන (2) දේව පනත් (3) දිව්‍ය පූජාව (4) ශුද්ධාත්ම දීමනා

16 ක්‍රිස්තුන් වහන්සේගෙන් පසුව සභා නායකත්වය පැවරුවේ කාටද?

(1) පේදුරු තුමාට (2) ජුවාම් තුමාට (3) ජාකොබ් තුමාට (4) ජෝශප් තුමාට

17 ශුද්ධාත්ම ඵලයක් නොවන්නේ,

(1) ස්නේහය (2) ප්‍රීතිය (3) සමාදානය (4) ධෛර්යය

18 ''නුඹේ මව්බිම ද, නුඹේ නෑදැයන් ද, නුඹේ පියාගේ ගෘහය ද අතහැර දමා මා පෙන්වන දේශයට යන්න.'' දෙවිපියා මෙසේ පවසන ලද්දේ කාටද?

(1) ආමොස්ට (2) ආබ්‍රහම්ට (3) ජොහාන්ට (4) මෝසෙස්ට

19 ශුද්ධාත්ම ඵල ගණන වන්නේ,

(1) 7 කි. (2) 12 කි. (3) 6 කි. (4) 10 කි.

20 පන්සලේ පියතුමා යන විරුදාවලිය ලබනුයේ,

(1) මයිකල් රුද්‍රිගු පියතුමා (2) ඩේමියන් පියතුමා

(3) මර්සලින් ජයකොඩි පියතුමා (4) කෝල්බේ පියතුමා

21 ජාත්‍යන්තර ''මැග්සේසේ'' සම්මානයෙන් පුද ලද මහා කවියකු වූ පියතුමා වන්නේ,

(1) ගරු බෙනඩික් ජෝශප් පියතුමා (2) අතිගරු එඩ්මන් පීරිස් රදගුරුතුමා

(3) ගරු මයිකල් ආන්ජලෝ පියතුමා (4) ගරු මර්සලින් ජයකොඩි පියතුමා

22 අනාගත මෝක්ෂ මහිමයේ පූර්ව ආශ්වාදයක් ලබාදෙන්නේ,

(1) පව් සමාවයි. (2) දිව්‍ය සත්ප්‍රසාදයයි.

(3) රෝගවලට සුවය ලැබීමයි. (4) බෙදාහදා ගැනීමයි.

23 ''සාමය ඇතිකරන්නේ භාග්‍යවන්තයෝ ය. ඔවුහු ....................................'' හිස්තැනට සුදුසු වාක්‍ය වන්නේ,

(1) දෙවියන්වහන්සේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝ ය.

(2) දේශය උරුම කරගන්නෝය.

(3) තෘප්තිමත් වන්නෝය.

(4) දෙවියන් වහන්සේ දකින්නෝය.

24 අප රටේ සිටින කාදිනල්තුමාගේ නම කුමක් ද?

(1) අතිගරු මැල්කම් රංජිත් හිමිපාණෝ

(2) අතිගරු තෝමස් කුරේ හිමිපාණෝ

(3) අතිගරු වියානි ප්‍රනාන්දු හිමිපාණෝ

(4) අතිගරු තෝමස් සෞන්දරනායගම් හිමිපාණෝ

25 ''මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇතිකරගන්නටත් පෙර පටන් මම නුඹ හඳුනාගතිමි.'' මෙය කීවේ,

(1) ජෙරමියා (2) යෙසායා (3) ආමොස් (4) කානාන්

26 දසපනතේ පස්වන පනත කුමක් ද?

(1) මව්පියන්ට සංග්‍රහ කරන්න (2) සොරකම් නොකරන්න

(3) ජීවිත විනාශ නොකරන්න (4) අන් වස්තු ආශා නොකරන්න

27 දිව්‍ය සත්ප්‍රසාදය නමැති ප්‍රසාද නිධානය ස්ථාපිත කරනු ලැබුයේ

(1) මහ සිකුරාදා (2) පාස්කු ඉරිදා

(3) ගොක් ඉරිදා (4) මහ බ්‍රහස්පතින්දා

28 දෙවියන්වහන්සේ මොසෙස්ට අනාවරණය වූයේ,

(1) ඇවිලෙන ගිනි පඳුරක් මගින් (2) දේදුන්නක් මගින්

(3) වළාකුලක් මගින් (4) ගිනිටැඹක් මගින්

29 ශුද්ධාත්මයාණන් ලැබූ මුල්ම පිරිස වන්නේ කීදෙනෙක් ද?

(1) 130 (2) 120 (3) 150 (4) 180

30 දේව රාජ්‍ය සම්බන්ධ උපමා කථාවක් නොවන්නේ,

(1) නිධානය (2) අබ ඇටය

(3) මුතුඇටය (4) පරිසිවරයා හා අයකැමියා

31 ශුද්ධ වූ පවුලට අයත් සාමාජිකයන් වන්නේ,

(1) මරියතුමී, ජුසේතුමා, ජේසුතුමා (2) මරියතුමී, ආනාතුමිය, සකරියස්තුමා

(3) ජුසේතුමා, ජේසුතුමා, ආනාතුමිය (4) ජේසුතුමා, මරියතුමී, අනනියස්

32 අප ශුද්ධාත්ම මන්දිරයක් බවට පත්වන්නේ කුමන ප්‍රසාද නිධානය ලබාගත් විටද?

(1) දිව්‍ය සත්ප්‍රසාදය (2) අභිවෘද්ධි ආලේපය

(3) ප්‍රසාද ස්නාපනය (4) පූජකවරය

33 ජුසේවාස් පියතුමා ගෝවේ සිට මෙහි පැමිණියේ කිනම් වර්ෂයක ද?

(1) 1686 (2) 1678 (3) 1658 (4) 1687

34 ජුසේවාස් පියතුමා අයත් නිකාය වන්නේ,

(1) ජේසු නිකාය (2) ෆ්‍රැන්සිස්කන් නිකාය

(3) ඔරතෝරියානු නිකාය (4) අගොස්තීනු නිකාය

35 කිතුනු දරුවකු වශයෙන් මා කළයුතු ප්‍රධාන දෙයකි

(1) දේව කැමැත්ත අනුව ජීවත්වීම. (2) යුතුකම් හා වගකීම් ඉටුකිරීම.

(3) අන් අයට හැකිතාක් උදව් කිරීම. (4) ඉතා උනන්දුවෙන් ඉගෙනගැනීම.

36 ''දැනටමත් පොරව ගස්මුල්වලට එල්ල කර ඇත. එබැවින් හොඳ ඵල නොදරන සියලු ගස් කපා ගින්නෙහි හෙළනු ඇත.'' මෙම කියමනෙහි තේරුම වන්නේ,

(1) දේශනා කිරීම පිණිස සුදුසු ස්ථානයක් සූදානම් කෙරෙන බවයි.

(2) දේව වචනය අසා යහපත් ලෙස ජීවත්විය යුතු බවයි.

(3) පව්වලට නිතරම පසුතැවිලි විය යුතු බවයි.

(4) අයහපත් ලෙස ජීවත් වූ අයට සුදුසු විපාකය ලැබෙන බවයි.

The National e-learning Portal for the General Education

37 පිතාවහන්සේ, පුත්‍රයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුන්වනු ලබන නමක් වන්නේ,

(1) ශුද්ධ වූ ත්‍රිත්වය (2) ශුද්ධ වූ පවුල

(3) සාන්තුවරයන් (4) නාම සාන්තුවරයන්

38 අපගේ උත්තම පූජකයාණන් වන්නේ කවුරුන් ද?

(1) මෙල්කිසදෙක් (2) දෙව්පියාණන්

(3) ක්‍රිස්තුන් වහන්සේ (4) අගරදගුරුතුමා

39 ජේසුස් වහන්සේ මුහුණදුන් පරීක්ෂා ගණන වන්නේ,

(1) 5 කි. (2) 3 කි. (3) 6 කි. (4) 2 කි.

40 ආදම් සහ ඒව කළ මුල්ම පාපය වන්නේ,

(1) මරණීය පාපය (2) ජන්ම පාපය (3) සුළු පව් (4) මහා පව්

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 (1) කිතුණුවන්ගේ අති පූජනීය ග්‍රන්ථය කුමක් ද?

(2) ශුද්ධාත්ම දීමනා 3 ක් නම් කරන්න.

(3) දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ජේසුස් වහන්සේ වැඩසිටින බව පැවසුවේ කවුද?

(4) දසපනතේ හතරවන පනත ලියාදක්වන්න.

(5) පූජක දිවියේ කාර්යයන් 3 ක් නම් කරන්න. (2 x 5 = 10)

02 (1) ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ජීවිතය වර්ධනය කරගත් ආකාරය ලියන්න.

(2) කිතුණු දරුවකු වශයෙන් ඔබ ඔබගේ ජීවිතය වර්ධනය කරගැනීමට ගන්නා පියවර 4 ක් ලියන්න.

03 (1) පවුලක් තුළ පැවතිය යුතු යහපත් ගුණාංග 5 ක් ලියන්න.

(2) කිතුණු පවුලක දෙමාපියන්ට පැවරෙන වගකීම් 3 ක් ලියන්න.

04 (1) කිතුතුමා පූජකවරය ස්ථාපිත කළේ කවදා ද?

(2) පූජකතුමන්ලා සමග සම්බන්ධ වී මෙතෙක් ඔබ කළ සේවාවන් ලියන්න.

(3) ''පූජකවරය උසස් කැඳවීමකි.'' මේ ගැන වචන 25 ක පමණ වෙනාවක් ලියන්න.

05 (1) ප්‍රසාද ස්නාපනය ගැන කෙටියෙන් හඳුන්වන්න.

(2) ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැක්කේ කිනම් අයටද?

(3) ප්‍රසාද ස්නාපනය ලැබීමෙන් ඔබ ලබන වරප්‍රසාද මොනවා ද?

06 (1) අන්තිම රාත්‍රී භෝජනයේ දී ජේසුස් වහන්සේ රොටී ගෙන තුතිපුදා ගෝලයන්ට දෙමින් පැවසූ වදන් මොනවා ද?

(2) පූජාප්‍රසාදිතුමා ඉටුකරන සේවාවන් 3 ක් ලියන්න.